ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි
වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
STU6317- ප්‍රාථමික අධ්‍යාපනය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.02 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ළමයාගේ විමුක්ති දායකයා ලෙස හැඳින්වූ රූසෝ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා පහක් (05) සඳහන් කරන්න.

02. ගුරුවරයෙකුට ප්‍රවේශ නිපුණතා වැඩසටහන තම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය සඳහා බෙහෙවින් වැදගත් වේ. මෙය තහවුරු කිරීමට කරුණු පහක් (05) ඉදිරිපත් කරන්න.

03. පොදු නිපුණතා හත නම් කරන්න. සන්නිවේදන නිපුණතා යටතට ගැනෙන විෂය ක්ෂේත්‍ර සඳහන් කරන්න.

04. ද්විතීයික අධ්‍යාපනය තුළ දක්නට නොලැබෙන නමුත් ප්‍රාථමික අධ්‍යාපනයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දක්නට ලැබෙන සුවිශේෂී (අංග) පහක් (05) ලියන්න.

05. සාර්ථක ගුරුවරයා කළ යුත්තේ ඉගැන්වීම නොව ඉගෙන ගැනීමට පහසුකම් සැලසීම ය. ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ ඉගෙන ගැනීමට පහසුකම් සැලසීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද භාවිත කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු මොනවා ද? නිර්වචනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. ප්‍රාථමික ශ්‍රේණි භාර ගුරුවරයෙකු විසින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ආධාරක තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු පහක් (05) ලියන්න.

08. ගුරු උපදේශක භූමිකාවේ වගකීම් පහක් (05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. මහත්මා ගාන්ධි අධ්‍යාපනය පිළිබඳ දැක්වූ දාර්ශනික අදහස් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. එම අදහස් වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යෝග්‍ය වන ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් තර්කානුකූල ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. i. "සමෝධානිත එළඹුම" යන්න උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. "සමෝධානිත ඉගෙනුම් එළඹුම" යොදා ගනිමින් විෂයමාලාව සංවිධානය කිරීමේ දී මුහුණදීමට සිදුවන ගැටලු උදාහරණ සහිත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. i. තක්සේරුකරණය හා ඇගයීම් යන සංකල්පවල ලක්ෂණ සංසන්දනය කරන්න. (ලකුණු 10)

ii. ප්‍රාථමික පාසල් සිසුන්ගේ සාධනය ඇගයීම සඳහා නිර්ණායක මූලික ඇගයීම ඵලදායී වන්නේ කෙසේද විමර්ශනාත්මක ව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. i. "ශිෂ්‍යයාගේ පූර්ණ සංවර්ධනය ප්‍රාථමික අධ්‍යාපනයේ ඉලක්කය විය යුතු ය." මේ පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

ii. ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ දී ශිෂ්‍ය කාර්යසාධන ගොනු පවත්වාගෙන යාම වැදගත්වන අවස්ථා සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. i. සාර්ථක ගුරුවරයා සිසුන්ට උගන්වන්නෙක් නොව සුසාධ්‍යකාරකයෙකි.

ගුරුවරයාගේ සුසාධ්‍යකරණ භූමිකාව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. අනෙකුත් ගුරුවරුන් හා සසඳා බලන විට ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයාට මුහුණදීමට වන සුවිශේෂී ගැටලු පහක් (05) ඉදිරිපත් කර එම ගැටලු විසඳා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.